" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

SLSI ISO 9001 SYSTEM CERTIFIED

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204. டென்சில் கொப்பேகடுவ மாவத்தை. பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| | | |
|---|---|---|
| ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary | දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599<br>ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601<br>ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk | පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone } 011 - 2093000 |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/PTR/11-3/FI/2024 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2023.11. 29 |

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම්(බ.ප.),
ලේකම්, (පළාත් පාලන / අධ්‍යාපන / සෞඛ්‍ය / කෘෂිකර්ම / මාර්ග) අමාත්‍යාංශය (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන / මූල්‍ය / සැලසුම් / ඉංජිනේරු)
පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2024</u>**

උක්ත මැයෙන් ඔබ අමතන ලද මගේ අංක: CSWP/PTR/20-3/FI/3-2024 හා 2023.10.18 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව, තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කරන ලද කාර්යාල සේවක සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2024 සම්බන්ධයෙන් අධ්‍යයනය කර තීරණයක් ලබා ගැනීම සඳහා, ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් මත බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක: GOS/ADM/6/02/86 හා 2023.10.18 දිනැති ලිපිය මඟින් කමිටුවක් පත් කරන ලදී. ඒ අනුව, ආණ්ඩුකාර ලේකම්ගේ අංක: GOS/ADM/6 හා 2023.11.16 දිනැති ලිපිය මඟින් අදාළ කමිටුව විසින් ලබා දී ඇති නිර්දේශයන් සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් සිය එකඟතාවය ලබා දුන් බව මා වෙත දන්වා ඇත. එම නිසා තාවකාලිකව අත්හිටුවන ලද කාර්යාල සේවක සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු නියෝගයන් 2024.02.15 දින සිට පහත පරිදි ක්‍රියාත්මක වේ.

03. 2024 වර්ෂයට අදාළව බස්නාහිර පළාත් කාර්යාල සේවක සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු ලැයිස්තුව, මගේ සමාංක හා 2023.10.10 දිනැති ලිපිය මඟින් බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ පිරිස් හා පුහුණු අංශයේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇති අතර, **<u>එම ස්ථාන මාරු ලේඛනයේ නිලධාරියාගේ නම ඉදිරියෙන් ස්ථාන මාරුව ක්‍රියාත්මක වන දිනය 2024.01.01 ලෙස සඳහන්ව ඇත්නම් එය, 2024.02.15 ලෙස සලකා කටයුතු කළ යුතු ය. නමුත්, ස්ථාන මාරු ලේඛනයේ නිලධාරියකුගේ නමට ඉදිරියෙන් 2024.01.01 හැර වෙනත් දිනයක් සඳහන් ව ඇත්නම් එදිනට අදාළ ස්ථාන මාරුව ක්‍රියාත්මක විය යුතු අතර, එකී දිනය 2024.02.15 දිනට පෙර දිනයක් වේ නම් එම නිලධාරීන්ගේ ද ස්ථාන මාරු ක්‍රියාත්මක වන දිනය 2024.02.15 සේ සැලකිය යුතු ය.</u>**

04. ඒ අනුව, වාර්ෂික ස්ථාන මාරු නියෝග ලද බස්නාහිර පළාත් කාර්යාල සේවක සේවයේ නිලධාරියකු නියමිත දිනයේදී ම තම ආයතනයෙන් මුදාහැරිය යුතු ය. ඒ සඳහා, එම නිලධාරියාගේ අනුප්‍රාප්තිකයා පැමිණෙන තෙක් නොසිට, ස්ථාන මාරු නියෝග ලද නිලධාරියාගේ රාජකාරි කටයුතු ආවරණය කිරීමට තාවකාලික වැඩපිළිවෙලක් අභ්‍යන්තර වශයෙන් යොදා ගැනීමට ආයතන ප්‍රධානියා ක්‍රියා කල යුතු අතර, අදාල වාර්ෂික ස්ථාන මාරු ලැයිස්තුවේ සඳහන් නිලධාරියා සේවයේ නියුතු සේවා ස්ථානය වෙතම පමණක් අනුප්‍රාප්තික නිලධාරියා අනුයුක්ත කිරීමට කටයුතු කල යුතු ය.

05. සුවිශේෂ හේතූන් මත මෙම ස්ථාන මාරු සම්බන්ධයෙන් යම් නිලධාරියෙක් කරුණු දැක්වීමක් ඉදිරිපත් කරන්නේ නම්, එකී කරුණු දැක්වීම මගේ අංක: **CSWP/PTR/20-3/FI/3-2024** හා **2023.06.23** දිනැති වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය සමඟ අමුණා ඇති කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ අංක **13** පරිශිෂ්ඨය ප්‍රකාරව සකස් කළ **CSWP/PTR/FO/14** ආකෘතියට අනුව **2023.12.11** දිනට ප්‍රථම (මගේ සමාංක **2023.10.10** දිනැති ලිපියට අදාළව නිසි ධූරාවලිය ඔස්සේ **CSWP/PTR/FO/14** ආකෘතිය අනුව ඉල්ලීම් යොමු කර ඇති නිලධාරීන් නැවත ඉල්ලීම් යොමු නොකළ යුතු ය) නිසි ධූරාවලිය මඟින් මෙම කාර්යාලය වෙත යොමු කළ යුතු බවත්, එදිනට පසුව ලැබෙන සියලුම අභියාචනා කිසිදු සලකා බැලීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බවත් කාරුණිකව දන්වමි.

06. මේ සම්බන්ධව ඔබ යටතේ පවතින සියලුම ආයතන දැනුවත් කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම්
බස්නාහිර පළාත

දුරකථන අංකය : 011-2092599
ෆැක්ස් අංකය : 011-2092601
විද්‍යුත් ලිපිනය : chiefsecwp@gmail.com